# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**2123/37 – 2019 මැයි 15 වැනි බදාදා – 2019.05.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 436/ඒ, සුදුවැල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කළුඅග්ගල නමැති ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඕ/එච්එන්ඩබ්ලිව්/2017/149 හා 2018.08.03 වැනි දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.1660ක් පමණ වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 1 – උණපඳුරේ ඕවිට නොහොත් අට්ටික්කාගහ ඕවිට නොහොත් උණපඳුරේ ඕවිට සහ අට්ටික්කාගහ ඕවිට – ප්‍රමාණය: හෙක්. 0.1660**

උතුරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි තෙලඹුගහවත්තේ කැබැල්ල සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: 5 වන සන්නද්ධ බුද්ධි බලකා කඳවුර පිහිටි හිමිකම් කියන අය සොයාගත නොහැකි මූණමුලේ වත්ත, කේ. ඒ. අනිල් හිමිකම් කියන ඇගලගේ ඕවිට නොහොත් පෙරිංගහ ඕවිට, නස්වාන් හිමිකම් කියන ඇගලගේ ඕවිට නොහොත් පෙරිංගහ ඕවිට සහ ඩී. ජී. මේරි ජස්ටින් හිමිකම් කියන ඇගලගේ ඕවිට සහ මඩවලඕවිට; දකුණට: කේ. ඒ. අනිල් හිමිකම් කියන ඇගලගේ ඕවිට නොහොත් පෙරිංගහ ඕවිට, නස්වාන් හිමිකම් කියන ඇගලගේ ඕවිට නොහොත් පෙරිංගහ ඕවිට, ඩී. ජී. මේරි ජස්ටින් හිමිකම් කියන ඇගලගේ ඕවිට, මඩවලඕවිට සහ පාර; බටහිරට: පාර, හිමිකම් කියන අය සොයාගත නොහැකි තෙලඹුගහ වත්තේ කැබැල්ල සහ මෙම ඉඩමේ ඉතිරි කොටස.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/4/2014/ඩී/328.
2019 පෙබරවාරි මස 06 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05 - 829


1A – G30075 – 18 (2019/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*